
‘අවංක මිනිසා ගේ
කැමැත්ත
මිල දී ගැනීමට
මුළු මහත් විශ්වය ම
අපොහොසත් වනු ඇත’
- මාටින් ලූතර් කිං

# චිරං ජයතු ප්‍රදීපා!

ආචාර්ය පණ්ඩිත් අමරදේව

සිංහල නාට්‍යාම්බරය එකලු කළ පුන් සඳ වන් සරත්චන්ද්‍ර ඇදුරාණන් ගේ "සිංහබාහු" ගීතාංග නාටකයෙ හි සිංහ සිවලී ලෙස රඟන්නට, ගයන්නට වාසනා ලද, ගේය, රංගන උභය මාධ්‍යයන් හි එක සේ සුපරිචිත ප්‍රදීපා ධර්මදාස නම් වන කලා ශිල්පිනිය වෙත ගලා එන සුබපැතුම් අතරට මගේ සුභාශිංසන ස්වරය ද මුසු කරනුයේ ඉමහත් සොම්නසිනි. සොම්නසිනි.

වේදිකා නාට්‍ය, ටෙලිනාට්‍ය, සිනමා, රූපවාහිනී, ගුවන් විදුලි සජීව සංගීත ප්‍රසංග ආදී සකලවිධ ක්ෂේත්‍රයන් රස ගන්වමින් වත්මන් කලා ලොව සිසාරා ප්‍රදීපා, ප්‍රතිභා ශ්‍රේණින් නඟා යන්නේ ය.

ප්‍රදීපා නම්වූ චතුර කලාවේදිනියට තවත් දිගු කලක් සිය කලා මෙහෙවරෙහි යෙදෙනු පිණිස ආයු වර්ණ, සැප, බල, නැණ සපුරා ලැබේවා!